සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ නාට්‍ය හා රංගකලාව I කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**◈නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. කාර්මික විප්ලවයෙන් පසුව භාවිතයට පැමිණි කලාව ලෙස සැලකෙන්නේ,
1. ජනප්‍රිය කලාවයි. 2. ලලිත කලාවයි. 3. ව්‍යවහාරික කලාවයි.
4. ගැමි කලාවයි. 5. ජන කලාවයි. (..........)

02. කලාව හා ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණයේදී ශිල්ප යටතට ගැනෙන්නේ,
1. කැටයම් 2. මූර්ති 3. චිත්‍ර 4. කාව්‍ය 5. නාටක (..........)

03. ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා අතර සතර අභිනයට යොදාගන්නා කලාව වන්නේ,
1. නර්තනය 2. සංගීතය 3. ඔපෙරා
4. නාට්‍ය 5. ඉඟිනළු (..........)

04. ප්‍රාසංගික නොවන කලාවක් වනුයේ,
1. සංගීතය 2. මුර්ති කලාව 3. නර්තනය
4. බැලේ 5. මුද්‍රා නාට්‍ය (..........)

05. නාට්‍යයක අත්‍යවශ්‍ය අංගත්‍රය වන්නේ,
1. පෙළ, නළුවා, ප්‍රේක්ෂකයා 2. පෙළ, නළුවා, අධ්‍යක්ෂකවරයා
3. පෙළ, නළුවා, අංගරචනය 4. නළුවා, අධ්‍යක්ෂ, ප්‍රේක්ෂකයා
5. පෙළ, නළුවා. නිෂ්පාදනය (..........

06. නෘත්‍ය යනු,
1. ආංගික හා සාත්වික අභින මාර්ගයෙන් කිසියම් බාවයක් ප්‍රකාශ කරන නර්තනයකි.
2. රිද්මයානුකුලව කෙරෙන අංග වික්ෂේපයයි.
3. ආංගික අභිනය ප්‍රමුඛ කරගත් නර්තන විලාශයකි.
4. චතුර්විධ අභිනමාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ කිරීම.
5. අර්ථ ප්‍රකාශයෙන් තොර රිද්මයානුකුල නර්තනයයි. (..........)

07. උඩරට නැටුමෙහි බොහෝවිට දක්නට ලැබෙන්නේ,
1. නෘත්‍ය ලක්ෂණය 2. නෘත්ත ලක්ෂණය
3. නාට්‍ය ලක්ෂණය 4. ලාස්‍ය ලක්ෂණය
5. නෘත්ත හා ලාස්‍ය ලක්ෂණය (..........)

08. 'නර්තකිය' මුවින් ගයන්නීය. හස්තයෙන් අර්ථය ප්‍රකට කරන්නීය.... යනුවෙන් නෘත්‍ය පිළිබඳව විස්තර වන්නේ,

1. අභිනය දර්පණයෙහි ය. 2. නාට්‍ය ශාස්ත්‍රයෙහි ය. 3. කාව්‍ය ශාස්ත්‍රයෙහි ය.
4. රස මංජරියෙහි ය. 5. භගවත් ගීතාවේ ය. (..........)

09. 'නාට්‍ය යනු ජීවිතයේ පැතිකඩකි' යනුවෙන් පවසා ඇත්තේ,

1. භරතමුණිය 2. ඇලඩයිස් නිකොල්ය 3. ධනංජය පඬිවරයාය.
4. බර්නාඩ් ෂෝ ය. 5. ඇරිස්ටෝල් ය. (..........)

10. චාරී, ස්ථානක, හස්ත හා කරණ වශයෙන් ප්‍රභේද වන්නේ,

1. නාට්‍යෝපකරනයි 2. ආංගික අභිනයයි. 3. රංග අභ්‍යාසයයි.
4. සාත්වික භාවයි. 5. අනුශාංගික අංගයි. (..........)

11. නාට්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන පරිදි සාත්වික භාවයන් ගණන වන්නේ,

1. 07 කි. 2. 12 කි. 3. 04 කි. 4. 8 කි. 5. 10 කි. (..........)

12. සාත්වික භාවයන්හි 'ප්‍රලය' ලෙසින් හඳුන්වන්නේ,

1. කඳුළු ගැලීමයි. 2. සිහි මුර්ජා වීමයි. 3. දහඩිය දැමීමයි.
4. පැහැය වෙනස් වීමයි. 5. කටහඬ බිඳීමයි. (..........)

13. සංස්කෘත නාට්‍යයේ එන විදූෂක ගෙනයන දණ්ඩකාෂ්ඨය හෙවත් වකුටු තුරයටිය අයත් වන්නේ,

1. ආහාර්ය අභිනයට 2. සාත්වික අභිනයට 3. ආංගික අභිනයට
4. පසුතල නිර්මාණ වලට 5. වේෂ භූෂණ වලට (..........)

14. නාට්‍ය නිෂ්පාදයේ දී මුලික වගකීම දරන්නා හඳුන්වනු ලබන්නේ,

1. නිෂ්පාදක 2. පෙළරචක 3. අධ්‍යක්ෂ
4. රංගභූමි පාලක 5. අර්ථපතිය (..........)

◈ **අංක 15 -20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත සඳහන් තොරතුරු ඇසුරින් ඉදිරිපත් කරන්න.**

A - සංගීතය B - ස්පොට් ලයිට් C - ප්‍රේක්ෂකයා
D - ප්‍රකාශ භාෂණ E - ඩිමරය F - ලාලිත්‍යයෙන් යුතු අංගහාර
G - වර්ණ චක්‍ර H - ව්‍යාවහාරෝචිත භාෂාව I - අංග රචනය
J - ප්‍රොසීනියම K - ප්ලැටියා L - අධ්‍යක්ෂ
M - රඟ මඬල N - වෙස් මෝස්තර O - නළුවා
P - පෙළ රචක

15. මෙහි නාට්‍ය ධර්මී ලක්ෂණ පිළිබඳ දැක්වෙන්නේ,

1. DJ 2. DF 3. FI 4. FN 5. FA (..........)

16. මෙහි රංග භූමිය හා සම්බන්ධ වන්නේ,

1. JKM 2. JKE 3. JMG 4. JMB 5. (..........)

17. නාට්‍යයකට අත්‍යවශ්‍ය අංගත්‍රය දැක්වෙන්නේ,

1. CMO 2. CLP 3. CLO 4. PLO 5. (..........)

18. මෙහි ආහාර්ය අභිනය හා සම්බන්ධ වන්නේ,

1. AIN 2. AIF 3. BIF 4. GIM 5. DET (..........)

19. මෙහි රංග ආලෝකකරණය හා සම්බන්ධ වන්නේ,

1. BN 2. EG 3. GI 4. BN 5. BI (..........)

20. නාට්‍යයේ පැවැත්ම රඳා පවතින්නේ,

1. L 2. O 3. P 4. C 5. LO (..........)

- **නිවැරදි පිළිතුර තෝරා ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. පහත සඳහන් ප්‍රකාශ අතුරින් පසුතල නිර්මාණ පිළිබඳව නිවැරදි කියමන වන්නේ,
    1. ප්‍රේක්ෂකයාගේ සිත ඇදෙන සේ වර්ණ සංයෝජනයක් තිබිය යුතුය.
    2. නූතන තාක්ෂණික උපක්‍රමය බහුලව භාවිතා කළ යුතුය.
    3. විශාලව දර්ශණය වනසේ සැකසිය යුතුය.
    4. විචිත්‍ර විය යුතුය.
    5. ප්‍රවාහන පහසුව හා බහු කාර්ය භාවිතය සඳහා සැකසිය යුතුය. (..........)

22. ගලායන එළිය යන අර්ථය දෙන ධාරා පහන් හඳුන්වන වෙනත් නමකි.
    1. ස්පොට් ලාම්පු 2. ස්ට්‍රිප් ලාම්පු 3. තීරු ලාම්පු
    4. ෆ්ලඩ් ලාම්පු 5. බැටින් ලාම්පු (..........)

23. රංග භූමියේ සිදුවන සියළුම කටයුතු වල වගකීම දරනු ලබන්නේ,
    1. රංග භූමි පාලකයා 2. අධ්‍යක්ෂය 3. නිෂ්පාදකයා
    4. නළුවාය 5. අර්ථපතිය (..........)

24. ලෝක ධර්මී නාට්‍යයකි.
    1. කැළනි පාලම 2. නරිබෑනා 3. බෙරහඬ
    4. ගුරු තරුව 5. අන්දරේලා (..........)

25. කාව්‍ය ශාස්ත්‍රයේ නිර්මාතෘ වන්නේ,
    1. භරතමුනි 2. ධනංජනය පඬිවරයා 3. ඇරිස්ටෝටල්
    4. ආකිමිඩිස් 5. භානුදත්ත මිශ්‍රා (..........)

26. ඇරිස්ටෝටල්ගේ මතයට අනුව නාටයයකදී භාජනයට ගත හැකි භාෂණ විධික්‍රම
    1. අටකි 2. හතකි 3. දහසයකි 4. තුනකි 5. නමයකි. (..........)

- **අංක 27 සිට 30 දක්වා ප්‍රශ්න වලට නොගැලපෙන වරණය තෝරන්න.**

27. ග්‍රීක නාට්‍ය කලාවේ මූලධර්ම හා බැඳි සංකල්ප වේ.
    1. ත්‍රිවිධ ඒකත්ව 2. භාව විශෝධනය 3. අර්ථ ප්‍රකෘති
    4. ආකූලිකරණය 5. ප්‍රත්‍යභිඥාණය (..........)

28. ශිථිලකරණ අභ්‍යාස සඳහා නිදසුනකි.
    1. ඉටිපන්දම දියවීම.
    2. බැලූනයක හුලං අරීම.
    3. හිම කන්ද දියවීම.
    4. ශරීරයේ පාද සිට හිස්මුදුන තෙක් ශරීර සැහැල්ලු කර ගැනීම.
    5. බැලූනයක් මුවින්පිබ උඩුගුවනේ රඳවා ගැනීම. (..........)

29. රංග ක්‍රීඩාව තුළින් ප්‍රගුණ කළ හැකි ගුණාංගයකි.
    1. ඉවසීම. 2. සාමූහික කටයුතු කිරීම. 3. හඬපාලනය.
    4. කණ්ඩායම් හැඟීම. 5. සහයෝගීතාව. (..........)

30. රංග ක්‍රීඩාවකි.
    1. අත්තල ක්‍රීඩාව. 2. මීයෝ සහ පූසෝ. 3. මකර වලිගය.
    4. හිමකන්ද දියවීම. 5. රාක්ෂයන් ගමට ඇවිල්ලා. (..........)

- **පහත සඳහන් නාටය ගීත ඇසුරින් 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**A.** **කියවුන වදන් ඇත**
**නොකිවුනු වදනුත් බොහො ඇත**
**ඇවිදින්ය ආපසු**
**සොල්දාදුවා යුදගිය**

**B.** **නැද්ද සිතේ අනුකම්පා මෙමාහට**
**නෑ මට අන් සරණා ...... වෙනු කරුණා**
**මා පෙම් වඩනා රජිඳු මනා**

**C.** **දී කිරි දී කිරි ගෙනාව දී කිරි**
**මිහිපිට කාටත් ගුණ දෙන දී කිරි**

**D.** **ශෝබාව දේ මෙපුර සිරිවිසිතුරු**
**බලනු මිතුරු මඟ පියකරු වූ**

**E.** **මුහුදු පතුලයට ඉඳලා මුතු ඇටයක නිදිකරවා**

31. නාට්‍ය කර්මී නාට්‍යයක ඇතුලත් ගීතයක් වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (..........)

32. නව නාට්‍ය ගීත වන්නේ,
1. AB ය. 2. CE ය. 3. CD ය. 4. AD ය. 5. BD ය. (..........)

33. තාරාවෝ ඉඟිලෙහි නාටයයේ ඇතුලත් ගීතය වන්නේ
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (..........)

34. 'A' ගීතය ඇතුලත් නාට්‍ය වන්නේ,
1. මුහුදු පුත්තු 2. සොල්දාදු උන්නැහැ 3. හුණුවටයේ කථාව
4. ජෙලර් උන්නැහැ 5. අහසින් වැටුණ මිනිස්සු (..........)

35. 'C' ගීතය ගයනු ලබන්නේ,
1. මැණිකේ අත්තනායක මිය. 2. චාන්දනී සෙනවිරත්න මිය.
3. ලක්ෂ්මී දමයන්ති මිය. 4. අනුලා බුලත්සිංහල මිය.
5. මාලනී බුලත්සිංහල මිය. (..........)

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

36. මිස්ටරි නාට්‍යය සඳහා යොදන වෙනත් නමකි.
1. මොරලිටි 2. ප්‍රාතිහාර්ය 3. සදුපදේශ
4. සදාචාර 5. මිරකල් (..........)

37. ඊඩිපස් රජ නාටයයේ එන චරිතයකි,
1. ජොකොස්ටා බිසව 2. ක්‍රොයෝන් 3. හීමන්
4. ලිසිස්ට්‍රාටා 5. ඉස්මෙන් (..........)

38. නාට්‍ය විචාරය යනු,
1. නාට්‍යයේ දුබලතා පෙන්වාදීමයි.
2. නාට්‍යයේ සාධනීය ලක්ෂණ ඉදිරිපත් කිරීමයි.
3. නාට්‍යයේ ගුණාත්මක බව සාකච්ඡා කිරීමයි.
4. නාට්‍යයේ අඩංගු තොරතුරු විශ්ලේෂණාත්මකව විග්‍ර කිරීමයි.
5. නාට්‍යයේ සංදර්ශනය විවේචනය කිරීමයි. (..........)

39. නාට්‍ය විචාරයේ දී අවධානය යොමුකළ යුත්තේ,
1. නාට්‍යයේ ශෛලිය පිළිබඳවය. 2. ඒ සඳහා යොදාගෙන ඇති සංගීතය පිළිබඳය.
3. වේෂ භූෂණ පිළිබඳවය. 4. තේමාව හා සන්දර්භය පිළිබඳවය.
5. ඉහත සඳහන් සියල්ලමය. (..........)

40. නාට්‍යයක් නිෂ්පාදනයට පෙර අවසර ලබාගත යුතු වන්නේ,
1. සංස්කෘතික අමාත්‍යාංශයෙනි. 2. නාට්‍ය අනුමණ්ඩලයෙනි.
3. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙනි. 4. ටවර්හොල් රඟහල පදනමෙනි.
5. ආරක්ෂක අමාත්‍යාංශයෙනි. (..........)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙවන වාර පරීක්ෂණය 2018**
**නාට්‍ය හා රංගකලාව**
12 ශ්‍රේණිය
**I පත්‍රය - II කොටස**

---

උපදෙස්:-

A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**A - කොටස**

01. ''කලාව යනු රසිකයා පිනවන අපූර්වත්වයෙන් යුතු සෞන්දර්යාත්මක නිර්මාණයකි''.
   i. කලාවේ බාහිර ලක්ෂණ සලකා කෙරෙන වර්ගීකරණය ලියන්න. (ලකුණු 04 යි)
   ii. කලාවේ ගුණාත්මක අගය සලකා බලා කෙරෙන වර්ගීකරණයේදී ව්‍යවහාරික කලාව ලෙසින් හඳුන්වන්නේ කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 05 යි)
   iii. ප්‍රාසාංගික කලා හා වෙනත් කලාවන් අතර වෙනස නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

02. 'නාට්‍ය පෙළක් රංගනයක් බවට පත්කිරීමේදී නළුවන් විසින් අනුගමනය කරනු ලබන ශිල්ප 'අභිනය' නමින් හඳුන්වනු ලැබේ.'
   i. අභිනය ප්‍රභේද කීයද? ඒ මොනවාද? (ලකුණු 04 යි)
   ii. ඒ එක එකක් විස්තර කර දක්වන්න. (ලකුණු 05 යි)
   iii. අභිනය නාට්‍යයේ දීභාවිතා වන අයුරු ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයක් ඇසුරින් නිදසුන් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06යි)

03. i. නාට්‍ය හා රංග කලාවේ දක්නට ලැබෙන මූලිකාංග 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. ඉන් දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)
   iii. ඉන් එක් මූලිකාංගයක් නාටය කලාවේදී භාවිතා වන අයුරු ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයක් ඇසුරින් පහදන්න. (ලකුණු 06 යි)

**B - කොටස**

04. භරතමුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව නාට්‍ය කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය.
   i එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. එම වර්ග දෙකෙහි ලක්ෂණ වෙන වෙනම ලැයිස්තුගත කරන්න. (ලකුණු 05 යි)
   iii. ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරින් එම ශෛලිය නාටය සඳහා කෙතෙක් දුරට භාවිතා කර ඇත්තේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05. ආධුනික නළුවෙකුට රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස වල යෙදීම තුළින් 'නළු පෞරුෂය' ගොඩ නඟ ගත හැකිය.'
   i. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   ii. ඔබ අභ්‍යාස කළ රංග ක්‍රීඩාවක නිරත වන අයුරු විස්තර කර දක්වන්න. (ලකුණු 05 යි)
   iii. රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස වල නිතර වීමෙන් නළුවෙකු තුළ වර්ධනය කරගත හැකි ගුණාංග මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 06 යි)

06. i. නාට්‍ය විචාරය යනු කුමක්ද? (ලකුණු 04 යි)
   ii. නාට්‍ය විචාරකයෙකු තුළ තිබිය යුතු ගුණාංග මොනවාද? (ලකුණු 05 යි)
   iii. නාට්‍ය විචාරය නාට්‍ය කලාවේ ප්‍රගමනයට කොතරම් දුරට ඉවහල් වන්නේ දැයි නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 57 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ නාට්‍ය හා රංගකලාව II කාලය පැය තුනයි

උපදෙස්

- I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ යොදන්න.**
  **පහත දැක්වෙන සංවාද / පද්‍ය / කාණ්ඩ ආශ්‍රයෙන් අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. අත්තක පිපි මලක් ලෙසේ - පෙත්තක ඇදි ඉරක් ලෙසේ
සත්තක මගෙ පුතුගේ යසේ - නෙත් දෙක හැර බලන් මෙසේ

B. අසාලා කීවේ වග තුගසියල්ලක්
යොදාලා ගන්න බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවෙ අපහට දෝසයක්
කපාලා දෙමිය ගම මහගෙ බරට ගාතයක්

C. කුමක්ද ඒ කිලිටි දෙය - කවර අයුරකින් ද එය පවිත්‍ර කළ යුතු

D. මේ මනුස්සානං ලංකා දොරටු බාසං නත්ථි

E. බැඳි පෙම් සටනින් - මම පැරදුනෙමි
දරුවන් සමගින් - යම් මම නික්මී
එනමුත් කුමරුනි - මතු සංසාරේ
ඔබ සොයනෙමි මම - භවයෙන් භවයේ

01. රටයකුම හා කොහොඹා කංකාරියට අයත් පද්‍ය කාණ්ඩයන් ය,

1. A හා C ය. 2. B හා C ය. 3. A හා B ය.
4. C හා D ය. 5. A හා D ය. (.........)

02. වේදිකා නාට්‍යවල අයත් සංවාද / පද්‍ය වන්නේ,

1. B හා C ය. 2. C හා E ය. 3. B හා C ය.
4. A හා C ය. 5. C හා D ය. (.........)

03. සශ්‍රීකත්වය අරමුණින් ඉදිරිපත් කෙරෙන යාතු කර්මයක පද්‍ය වනුයේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (.........)

04. කාන්තාවන් වෙනුවෙන් කෙරෙන ශාන්ති කර්මයකට අයත් පද්‍යයක් වන්නේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (.........)

05. සූනියම් යාගයෙහි අයත් සංවාද කාණ්ඩය වන්නේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (.........)

**පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 6 සිට 12 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - මැණික්පාල | F - මංගර කුමරු | K - දිවි දොස් |
| B - සශ්‍රීකත්වය | G - ඔඩ්ඩිස යාගය | L - සංඛපාල රජු |
| C - කපුයක්කාරිය | H - මහාකෝල සන්නි යකා | M - නාමල් කුමරි |
| D - විජය රජු | I - දළ කුමරු | N - සේරමන් රජු |
| E - යුගාසන බණ | J - පිරිත් පිංකම | O - රෝග නිවාරණය |

06. බෞද්ධ පූජා කර්ම හා සම්බන්ධ වන්නේ,

1. A හා J ය. 2. B හා E ය. 3. E හා J ය.

4. I හා K ය. 5. C හා I ය. (.........)

07. කෙහොඹා කංකාරිය හා සම්බන්ධ වන්නේ,

1. D හා K ය. 2. B හා G ය. 3. C හා D ය.

4. E හා F ය. 5. L හා N ය. (.........)

08. දේශීය ශාන්ති කර්ම හා සම්බන්ධ පොදු ලක්ෂණ වන්නේ,

1. A හා B ය. 2. A හා J ය. 3. B හා O ය.

4. B හා D ය. 5. K හා O ය. (.........)

09. සූනියම් යාගය සමඟ සම්බන්ධ වන්නේ,

1. A හා G ය. 2. B හා H ය. 3. C හා M ය.

4. D හා N ය. 5. F හා L ය. (.........)

10. කිරි මඩුව සමඟ සම්බන්ධ වන්නේ,

1. A හා K ය. 2. C හා I ය. 3. F හා M ය.

4. I හා L ය. 5. F හා I ය. (.........)

11. 18 සන්නිය හා සම්බන්ධ වන්නේ,

1. A හා O ය. 2. D හා G ය. 3. F හා N ය.

4. H හා L ය. 5. I හා O ය. (.........)

12. රට යකුම හා සම්බන්ධ වන්නේ,

1. A හා L ය. 2. C හා M ය. 3. B හා O ය.

4. C හා L ය. 5. K හා N ය. (.........)

- **නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

13. ග්‍රීක නාට්‍ය කලාවේ දියොනීසස් දෙවියන්ගේ අපර නාමය වන්නේ,
    1. ෆ්රැනිබොස් ය. 2. ප්‍රටීනස් ය. 3. බොයිරිලොස් ය.
    4. ඩිතුරොම්බොස් ය. 5. මෙනන්ඩ්‍රොස් ය. (.........)

14. 'දියෝනිසස් මම වෙමි' යි පවසමින් ලෝකයේ මුල්ම නළුවා බවට පත් වූයේ,
    1. තෙස්පිස් ය. 2. ඊස්කිලස් ය. 3. ඇරිස්ටොෆානිස් ය.
    4. ශේක්ස්පියර් ය. 5. කාලිදාස ය. (.........)

15. උදයවරුවේ සිට සවස් කාලය වනතුරු නාට්‍ය රඟ දැක්වූ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,
    1. සංස්කෘත සම්ප්‍රදාය 2. ග්‍රීක සම්ප්‍රදාය 3. බුන්රකු
    4. නෝ සම්ප්‍රදාය 5. රෝම සම්ප්‍රදාය (.........)

16. පහත දැක්වෙන නාට්‍ය අතුරින් ග්‍රීක ප්‍රහසනය වන්නේ,
    1. ඉක්නෙව්ටා ඉ 2. ප්‍රොමීතියස් බන්ධනය. 3. කුක්ලෝප්ස්
    4. අල්කස්ටීස් 5. වළාකුළු (.........)

17. ග්‍රීක කොමඩියක ගායන වෘන්දයේ සංඛ්‍යාව වූයේ,
    1. 12 යි. 2. 15 යි. 3. 20 යි.
    4. 24 යි. 5. 50 යි. (.........)

18. පැරණි ග්‍රීක නාට්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1. රඟ දක්වන ලද්දේ සන්ධ්‍යා භාගයේදී ය. 2. නාට්‍ය කෘතිය අංකවලට බෙදා දක්වා තිබුණි.
    3. නාට්‍ය රචකයා 'කවි' නමින් හැඳින්වුණි. 4. සතර අභිනය භාවිතා විය.
    5. නිෂ්පාදනය භාරවූයේ වෘත්තිකයෙකුට ය. (.........)

19. මිලිටෝස් ලුණ්ටනය යන ග්‍රීක නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,
    1. ෆ්රැනිබොස් ය. 2. බොයිරිලොස් ය. 3. ඊස්කිලස් ය.
    4. ඇරිස්ටොෆානිස් ය. 5. පුටීනස් ය. (.........)

20. ග්‍රීක නාට්‍ය කලාවේ දෙවන නළුවකු හා තුන්වන නළුවෙකු පිළිවෙළින් එක් කරනු ලැබුයේ.
    1. තෙස්පිස් හා ඊස්කිලස් ය. 2. තෙස්පිස් හා සෙෆොක්ලීස් ය.
    3. තෙස්පිස් හා යුරිපිඩීස් ය. 4. තෙස්පිස් හා ඇරිස්ටොෆානිස් ය.
    5. ඊස්කිලස් හා සොෆොක්ලීස් ය. (.........)

21. ඇරිස්ටෝටල් දක්වන පරිදි ට්‍රැජිඩියක නායකයා හැමතින්ම,
    1. මධ්‍යස්ථ පුද්ගලයෙක් විය යුතුය. 2. දුෂ්ඨ පුද්ගලයෙක් විය යුතුය.
    3. ඒකාධිපති පුද්ගලයෙක් විය යුතුය. 4. ආත්මාර්ථකාමී පුද්ගලයෙක් විය යුතුය.
    5. යටහත් පහත් පුද්ගලයෙක් විය යුතුය. (.........)

22. ග්‍රීක කොමිඩියේ පරමාර්ථ වූයේ,
    1. විනෝදාස්වාදය යි. 2. සශ්‍රීකත්වය යි.
    3. හාස්‍ය හා උපහාසය දැනවීමයි. 4. දුකින් කෙළවර වීමයි.
    5. උපහාසයට ලක් කිරීමයි. (.........)

23. ට්‍රැජඩි, කොමඩි, සැටර් හා වීර කාව්‍ය වශයෙන් කාව්‍ය වර්ග 04 ක් පිළිබඳ සඳහන් වන්නේ,
1. නාට්‍ය ශාස්ත්‍රයේ ය. 2. කාව්‍ය ශාස්ත්‍රයේ ය. 3. දස රූපයේ ය.
4. ගැමි නාටකයේ ය. 5. අභිනය දර්පණයේ ය. (.........)

24. දැනට සම්පූර්ණයෙන්ම ඉතිරි වී ඇති සැටර් නාට්‍යයක් වන්නේ,
1. යුරිපිඩිස්ගේ කුක්ලොප්ස් ය. 2. සොෆොක්ලීස්ගේ ඉක්නෙව්ටා ඉ ය.
3. සොෆොක්ලීස්ගේ කුක්ලොප්ස් ය. 4. යුරිපිඩිස්ගේ ඉක්නෙව්ටා ඉ ය.
5. ඊස්කිලස්ගේ කුක්ලොප්ස් ය. (.........)

25. ''දැන් ඒ ගැන සොයා ඇති ඵලය කුමක්ද? ඒ ගැන සොයන්නේ කුමකට ද..... කුමක් වූවත් දෙවියන්ගේ නාමෙට නවත්වන්න ඔය දේ, ඔබට තව දුරටත් ජීවත් වීමට ඕනෑ නම් නවත්වන්න ඔය දේ......''
ඊඩිපස් රජ නාට්‍යයේ එන ඉහත සංවාදය නික්මෙනුයේ,
1. ගායන වෘන්දය වෙතින් ය. 2. ඊඩිපස් රජ වෙතින් ය.
3. ක්‍රියෝන් වෙතින් ය. 4. ජොකෙස්ටා වෙතින් ය.
5. තෛරේසියස් වෙතින් ය. (.........)

26. ග්‍රීක සම්ප්‍රදායේ, ට්‍රැජඩි, කොමඩි, සැටර් යන නාට්‍ය වර්ගයන්ට අයත් නාට්‍ය නිර්මාණ සහිත නිවැරදි වරණය වන්නේ,
1. ඊඩිපස් රජ - ඇන්ටිගනී - කුක්ලොප් ය.
2. ඇජැක්ස් - ද බර්ඩ්ස් - ඉක්නෙව්ටා ඉ.
3. ඇල්කස්ටිස් - ඉලෙක්ට්‍රා - කුක්ලොප්ස්.
4. ෆිලොක්ටේටස් - ද පර්සියන්ස් - යාදින්නෝ.
5. ප්ලූටස් - ඊඩිපස් රජ - ඉක්නෙව්ටා ඉ. (.........)

- **අංක 27 - 30 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

27. ග්‍රීක ට්‍රැජඩියක ප්‍රධාන ලක්ෂණය වන්නේ,
1. නාට්‍ය වස්තුව පශ්චාද් දෘෂ්ඨී කථන ස්වරූපයෙන් ගොඩනගනු ලැබ තිබීම.
2. නායකයා ආදර්ශවත් චරිතයක් වුවද, ඔහු අතින් සිදුවන කිසියම් වරදක් නිසා ඛේදාන්ත ඉරණමකට ගොදුරු වීම.
3. සියලුම සිද්ධි කාලානුරූපව හා තර්කානුකූලව ගොඩනගනු ලැබ තිබීම.
4. සාමාන්‍යයෙන් ගායන වෘන්දය හා නළුවන් සඳහා වෙනම රංගස්ථල දෙකක් වෙන්වී තිබීම.
5. සම්පූර්ණ නාට්‍යයම පද්‍යයෙන් රචනා වී තිබීම. (.........)

28. පුරාණෝක්ති, වස්තු කොටගෙන ඇති ග්‍රීක නාට්‍ය වන්නේ,
1. ඊඩිපස් රජ 2. මීඩියා
3. ඇගමෙම්නොන් 4. සෙවන් අගේන්ස් ද තිබ්ස්
5. ඇන්ටිගනී (.........)

29. ග්‍රීක සුඛාන්ත නාට්‍යයක (කොමඩි) ප්‍රධාන ලක්ෂණය වන්නේ,
1. නළුවන් වෙස් මුහුණු පැළඳීමයි.
2. විසිහතර දෙනෙකුගෙන් යුතුගානවෘන්දයක් යොදා ගැනීම.
3. ගාන වෘන්දය සටුරයන්ගෙන් සමන්විත වීම.
4. නාට්‍ය ප්‍රීතියෙන් අවසන් වීම.
5. නාට්‍යවල දෙබස්, හාස්‍යය හා උපහාසය ප්‍රබලව ඉස්මතු කිරීම. (.........)

30. සටූර නාට්‍යයක්,

1. ට්‍රැජෝඩි තුනක් අවසානයේ රඟ දැක්විණි
2. සට්‍රයන්ගෙන් සමන්විත ගාන වෘන්දයකින් සමන්විතය.
3. රචනා කරන ලද්දේ, කොමඩි නාට්‍ය රචකයන් විසින්මය.
4. ප්‍රේක්ෂකයාට හාස්‍ය රසය ලබාදීමේ අරමුනින් රඟ දැක්විණි.
5. කුක්ලෝප්ස්, ඊස්කිලස්ගේ සැටර් නාට්‍යයකි. (.........)

- **පහත දැක්වෙන 1 රූපය හා 2 රූපය ඇසුරින් අංක 31 - 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**







31. 1 රූපයෙන් දැක්වෙන වේදිකාවේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. රංග භූමිය යි.
2. ලෝජියම් ය.
3. පැරඩෝස් ය.
4. තෙයටෝන් ය.
5. තයිමිලි ය. (.........)

32. 1 රූපයේ B අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. පැරසීනියම් ය.
2. පැරඩොස් ය.
3. ඔකෙස්ට්‍රා ය.
4. ප්‍රොසීනියම් ය.
5. ස්කීනි ය. (.........)

33. 1 රූපයේ C අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. ස්කීනිය
2. පැරසීනියම්
3. පැරඩෝස්
4. එපිසීනියම්
5. ඔර්කෙස්ට්‍රා (.........)

34. 2 රූපයේ D අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. එපිසීනියම්
2. පැරසීනියම්
3. ලොජියම්
4. තයිම්ලිය
5. ප්‍රොසීනියම් (.........)

35. 2 රූපයේ E අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. ප්‍රොසීනියම්
2. ලොජියම්
3. තයිම්ලය
4. පැරඩෝස්
5. ඔකෙස්ට්‍රාව (.........)

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

36. මෙහි දැක්වෙන වෙස් මුහුණ වන්නේ,



1. කෝල සන්නිය හා දෙමළ සන්නිය
2. අමුක්කු සන්නිය හා දෙමළ සන්නිය
3. වෙඩි සන්නිය හා ගොළු සන්නිය
4. බිහිරි සන්නිය හා වැදි සන්නිය
5. බිහිරි සන්නිය හා කණ සන්නිය (.........)

37. ඉහත වෙස් මුහුණු පැළඳගෙන කරනු ලබන ශාන්තිකර්මය වන්නේ,
1. සූනියම් යාගය
2. රට යකුම
3. සන්නියකුම
4. දෙවොල් මඩුව
5. මහසොහොන් සමයම (.........)

38. දකුණු පස රූප සටහනින් දැක්වෙන දර්ශනය අන්තර්ගත වන්නේ,



1. සන්නියකුමේ ය.
2. දොවොල් මඩුවේ ය.
3. රට යකුමේ ය.
4. සූනියම් යාගයේ ය.
5. කොහොඹා කංකාරියේ ය. (.........)

39. දකුණුපස රූප සටහනින් දැක්වෙන නාට්‍යමය අවස්ථාව දැකිය හැකි වන්නේ,



1. සූනියම් යාගයේ වඩිග පටුනෙහි ය.
2. රට යකුමේ දොළහ පෙළපාලියෙහි ය.
3. කොහොඹා කංකාරියේ ගුරුගේ මාලාවෙහි ය.
4. සන්නියකුමෙහි සූනියම් යක්ෂණිය පැමිණීමෙහි ය.
5. දොවොල් මඩුවේ අඹ විදමනෙහි ය. (.........)

40. දකුණු පස ඡායාරූපයේ දැක්වෙන ප්‍රකට ග්‍රීක නාට්‍යකරුවා වන්නේ,



1. තෙස්පීස් ය.
2. ඊස්කිලස් ය.
3. යුරිපිඩීස් ය.
4. සොෆොක්ලීස් ය.
5. ඇරිස්ටොෆානීස් ය. (.........)

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙවන වාර පරීක්ෂණය 2018
## නාට්‍ය හා රංගකලාව

12 ශ්‍රේණිය - **II** පත්‍රය

## IIකොටස

◈ **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

### A - දේශීය නාට්‍ය කලාව

01. i. ජීවිතයේ විවිධ අවස්ථාවල අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ අභිචාර විධි දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. බෞද්ධ පූජාකර්ම දෙකක් නම් කර, ඉන් එක් බෞද්ධ පූජා කර්මයකට පාදක වූ කථා වස්තුව කෙටියෙන් ලියන්න. (ලකුණු 05 යි)

iii. ඉහත 02 කොටසෙහි නම් කරන ලද බෞද්ධ පූජාකර්මයක ඉස්මතු කෙරෙන නාට්‍යමය අංකුර අවස්ථා පිළිබඳව විමසුමක් කරන්න. (ලකුණු 06 යි)

02. i. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ශාන්තිකර්ම එකක් බැගින් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ශාන්තිකර්ම පැවැත්වීමෙන් අපේක්ෂා කරන අරමුණු පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි)

iii. ඉහත (1) කොටසෙහි සඳහන් කරන ලද එක් ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 06 යි)

03. i. කුවේණි නාට්‍යයේ ප්‍රධාන තේමාව කුමක්ද? (ලකුණු 04 යි)

ii. කුවේණි නාට්‍යයට පසුබිම් වූ කථාව සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)

iii. කුවේණි නාට්‍යයේ එන චරිත තුළින් ලබාදෙන ජීවන දෘෂ්ටිය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 06 යි)

### B - කොටස

04. i. ග්‍රීක නාට්‍ය රචකයින් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ග්‍රීක රංගනයේ එන ගායන වෘන්දයෙහි කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. ග්‍රීක කොමඩියක අන්තර්ගත විශේෂ ලක්ෂණ පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 06 යි)

05 i. මධ්‍යකාලීන යුගයේ ජනවන්දනා නාට්‍ය රංගගත කරන ලද වේදිකා වර්ග 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ජනවන්දනා නාට්‍ය, පල්ලියෙන් පිටත රඟ දැක්වීමට හේතු වූ කරුණු පහක් නම් කරන්න. (ලකුණු 05 යි)

iii. මධ්‍යකාලීන යුගයේ දී මොරලිටි නාට්‍ය රංගනය කිරීම සඳහා භාවිතා කරන ලද විවිධ රංග උපක්‍රම පිළිබඳ විග්‍රයක් කරන්න. (ලකුණු 06 යි)

06. i. ඊඩිපස් රජ නාට්‍යයේ එන ප්‍රධාන චරිත හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඊඩිපස් රජ නාට්‍යයේ දී වේදිකාව මත නිරූපණය නොවන නමුත්, දූතයන් හෝ අත්වැල් ගායක කණ්ඩායම මගින් ප්‍රේක්ෂකයා වෙත හෙළිදරව් කරන භීෂණ ක්‍රියා පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. ඊඩිපස් රජ නාට්‍ය පෙළෙන් මතුකර ගතහැකි ජීවන දෘෂ්ටිය විශ්ලේෂණය කරන්න. (ලකුණු 06 යි)

**නැතහොත්**

i. රූකඩ ගෙදර නාට්‍යයේ එන ප්‍රධාන චරිත හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. රූකඩ ගෙදර නාට්‍ය විකාශනයේදී යොදාගෙන ඇති සංකේත භාවිතය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. රූකඩ ගෙදර නාට්‍යයේ නුවුරාගේ ක්‍රියා කලාපය සාධාරණද? අසාධාරණ ද? ඔබේ මතයට හේතු දක්වන්න. (ලකුණු 06 යි)

# දෙවන වාර පරීක්ෂණය 2018 - නාට්‍ය හා රංගකලාව

## 12 ශ්‍රේණිය - I පත්‍රය

---

### I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 4 | 21. 5 | 31. 2 |
| 2. 1 | 12. 2 | 22. 4 | 32. 3 |
| 3. 4 | 13. 1 | 23. 1 | 33. 4 |
| 4. 2 | 14. 3 | 24. 1 | 34. 3 |
| 5. 1 | 15. 2 | 25. 3 | 35. 4 |
| 6. 1 | 16. 1 | 26. 2 | 36. 2 |
| 7. 2 | 17. 3 | 27. 3 | 37. 1 |
| 8. 1 | 18. 1 | 28. 4 | 38. 4 |
| 9. 4 | 19. 2 | 29. 3 | 39. 5 |
| 10. 2 | 20. 4 | 30. 4 | 40. 3 |

### II කොටස - පිළිතුරු

#### A - කොටස

01. i) i. 01. ප්‍රකෘතික කලා 02. ගැමි කලා 03. ලලිත කලා (ල. 04) දෙකක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

ii. යන්ත්‍ර සූත්‍ර වලින් භාණ්ඩ නිපදවීමේදී ඒවායේ හැඩය හා වර්ණය ආදියට කලාත්මක ලක්ෂණ කරගනිමින් ඒ සඳහා වෙළඳපල ඉල්ලුම වැඩි කර ගැනීම සඳහා මෙන්ම භාණ්ඩ ජනප්‍රිය කරවීම සඳහා යොදාගනු ලබන පෝස්ටර් දැන්වීම් පුවරු ආදිය සඳහා කලා මාධ්‍ය යොදාගනැමේ ව්‍යවහාරික කලාවයි. මෙය කාර්මික විප්ලවයෙන් පසුව භාවිතයට පැමිණි බව සඳහන් වුනද ශිෂ්ඨාචාරයේ මුල් යුගයේ පවා භාණ්ඩ නිෂ්පාදනයේ දී මෙම ව්‍යවාහරික කලාව යොදගත් බවට සාධක හමුවේ.

iii. ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් වේදිකාවක් තුළ සජීවිව ඉදිරිපත් කිරීම.
ප්‍රේක්ෂක ප්‍රතිචාර මත පදනම් වීම.
නිශ්චිත කාලයක් තුළ ඉදිරිපත් කිරීම.
ආනුශංගික කලාවන්ගේ සුසංයෝගය ආදී කරුණු නිදසුන් දෙමින් සාකච්ඡා කිරීම සඳහා (ලකුණු 06)

02. i) ප්‍රභේද 04 යි. 01. ආංගික අභිනය 02. වාචික අභිනය 03. සාත්වික අභිනය 04. ආහාර්ය අභිනය (ල. 04)

ii) ආගික අභිනය :- අඟ පසඟ චලනයෙන් අදහස් ප්‍රකාශ කිරීම.
වාචික අභිනය :- දෙබස්, සංවාද, ගීත ආදිය භාවිත කරමින් අදහස් ප්‍රකාශනය
සාත්වික අභිනය :- මුහුණේ උපාංග චලනයෙන් අදහස් ප්‍රකාශ කිරීම.
ආහාර්ය අභිනය :-වේෂ භූෂණ, අංග රචනය, ආලෝකය, සංගීතය, නාට්‍යෝපකරණ වැනි වේදිකාවට බැහැරින් ගෙනන දෑ උපයෝගී කර ගෙන අදහස් ප්‍රකාශනය (ල. 05)

iii) ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයක් නිදසුන් කොට ගනිමින් එහි වාචික අභිනය වන සංවාද, ගීත ස්වගත ආදිය නිදසුන් කොට ගැනීම රංග රචනයයේදී ඇති ආකාරය සාත්වික අභිනය භාවිත වන අවස්ථා, ඇඳුම් පැළඳුම් සංගීතය හා රංග ආලෝකරණය පිළිබඳව නිදසුන් දෙමින් ඉදිරිපත් කිරීම සඳහා (ල. 06)

03) i) අධ්‍යක්ෂ, නිෂ්පාදන, රංග භූමිය, රංග ආලෝකරණය, වේෂ භූෂණ, රංගභූමි අලංකරණය, රංග වින්‍යාසය.. ආදී වශයෙන් (ල.04)

ii) ළමයා විස්තර කර ඇති අංග දෙකකට ලකුණු ලබා දෙන්න. (2 ½ බැගින්)

iii) ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයක මුලිකාංග දෙකක් යොදාගෙන ඇති අයුරු නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් (ල.06)

**B - කොටස**

04. i. නාට්‍ය ධර්මී ශෛලිය ලෝක ධර්මී ශෛලිය

ii. ලෝක ධර්මී
01. ව්‍යවහාරෝචිත භාෂාව
02. ස්වභාවික අංග චලන
03. ස්වභාවික ඇඳුම් පැළඳුම්
04. අංග රචන හා රංගාලෝකය මගින් ස්වභාවිකත්වය මතු කිරීම.... ආදී

නාට්‍ය ධර්මී
01. ලාලිත්‍යයෙන් යුතු අංගහාර
02. කාව්‍යාත්මක බස් වහර
03. සියළු අභිනයක් අලංකාර විලාශයෙන් යුක්තවීම
04. ගීත බහුල භාවිතා කිරීම
05. භාෂණ ක්‍රම භාවිතය ආදීය ලියා ඇත්නම් (ල. 05)

iii. නැරඹූ නාට්‍යක් ඇසුරින් ලෝක ධර්මී නො නාට්‍ය ධර්මී ශෛලිය විදහා දැක්වෙන අයුරු විස්තර කර ඇත්නම් (ල. 06)

05. i. රංග අභ්‍යාස
නළුවෙකු විසින් කායික මානසික සමබරතාව ඇතිකර ගැනිම සඳහා කරනු ලබන අභ්‍යාස .
රංග ක්‍රීඩා
නළුවෙකු විසින් සාමුහකත්වය, ඉවසීම ආදී ගුණාංග පුරුදු පුහුණු කිරීම සඳහා කරනු ලබන ක්‍රීඩා

ii. රංග ක්‍රීඩාව නම් කර විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05) (මීයෝ පූසෝ, අත්තල ක්‍රීඩාව, අත්තල ක්‍රීඩාව ආදී)

iii. ඉවසීම, කණ්ඩායම් හැඟීම්, අභියෝග වලට මුහුණ දීම, සාමුහික බව, කායික මානසික සමබරතාව, ජය පරාජය විඳගැනීම ආදී.

06. i. නාට්‍ය වස්තුව, රංග ශෛලිය, තේමාව, ගැටුම, නාටෝචිත අවස්ථා ආදී අංග කෙතෙක් දුරට ගැලපේද යන්න විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීම. (ල. 04)

ii. නිර්මාණ රසවින්දනයේ යාවත්කාලීන විය යුතුයි.
විවිධ ශෛලියේ නාට්‍ය රසවිඳින්නෙකු විය යුතුයි.
විවිධ විචාර සිද්ධාන්ත අධ්‍යයනය කරන අයෙකු විය යුතුයි.
බොහෝ ඇසුපිරූ තැන් ඇත්තෙකු විය යුතුයි.
නා නා විධ කෘති හඳුනාගත යුතුය.
තුළනාත්මක දෘෂ්ඨියක් ඇත්තෙකු විය යුතුයි. (ල. 05)

iii. ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න. (ල. 06)

# නාට්‍ය හා රංගකලාව 2018 - 12 ශ්‍රේණිය - II පත්‍රය

## I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 4 | 21. 1 | 31. 4 |
| 2. 2 | 12. 2 | 22. 1 | 32. 2 |
| 3. 2 | 13. 4 | 23. 2 | 33. 1 |
| 4. 1 | 14. 1 | 24. 5 | 34. 2 |
| 5. 4 | 15. 2 | 25. 4 | 35. 4 |
| 6. 3 | 16. 5 | 26. 2 | 36. 2 |
| 7. 1 | 17. 4 | 27. 3 | 37. 3 |
| 8. 3 | 18. 3 | 28. 3 | 38. 3 |
| 9. 1 | 19. 1 | 29. 4 | 39. 1 |
| 10. 5 | 20. 5 | 30. 4 | 40. 4 |

01. i) i. දරු ප්‍රසූතිය පහසු කිරීමට - ගලක් බඩ වැදගත් ඇදුරෙකු ගල සොලවමින් මන්ත්‍ර ජප කිරීම.

ii. ධීවර ජනතාව - මත්ස්‍ය රූපයක් සාදා දියට දැමීම.

iii. කිඹුලන් ඇල්ලීමට - බත් ගුලි තුනක් ගිල දැමීම.

iv. ඇසෙහි නාගනයක් සෑදුනු විම - ඉර නැග ඒමට පළමු කිසිවෙකු සමග කථා නොකොට මුත්‍ර ස්වල්පයක් හෝ තුත්තිරි ගසක අග රැඳී කිරි ඇසේ ගෑම.

v. සශ්‍රීකත්වය පතා - හිරු දෙවියන් පිදීම.
ඉහත කරුණු වලින් දෙකක් නම් කර ඇත්නම් (ල. 04)

ii) බෞද්ධ පූජා කර්ම - පිරිත් පිංකම, ආලවක දමනය, යුගාසන බණ, දොරකඩ අස්න, මිලින්ද ප්‍රශ්නය

මින් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 02 යි. එක් පූජා කර්මයකට අදාල කථා වස්තුව කෙටියෙන් නිවැරදිව ලියා ඇත්නම් ල. 03

iii) නාට්‍යමය අංකුර අවස්ථා - සමාරෝපය, සංවාද භාවිතය, අනුකරණ අනුරූපණය, චරිත නිරූපණය, අවස්ථා නිරූපණය, රංග භූමි භාවිතය ප්‍රේක්ෂක සහභාගීත්වය, රංග භාණ් භාවිතය ආදියෙන් කරුනු තුනක්වත් විස්තර කර තිබේ නම් ලකුණු 06

02. i) උඩරට සම්ප්‍රදාය - කොහොඹා කංකාරිය, වලියක් මංගල්‍යය, කඩවර පිදීම.
පහතරට සම්ප්‍රදාය - දෙවොල් මඩුව, රට යකුම (රිද්දි යාගය) සූනියම් යාගය, සන්නි යකුම (දහඅට සන්නිය)
සබරගමු සම්ප්‍රදාය - පහන් මඩුව, ගම්මඩුව, කිරි මඩුව, හැල්ලුම් මඩුව, පූනා මඩුව, ගි මඩුව, දානෙ මඩුව.
සම්ප්‍රදායන් තුනට අයත් ශාන්තිකර්ම එකක් බැගින් සඳහන් කර ඇත්නම් (ල. 03)

ii) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු
පොදු අරමුණු - සශ්‍රිකත්වය , සෞභාග්‍ය, සෙත් පැතීම, වසංගත දුරු කර ගැනීම.
පෞද්ගලික අරමුණු :- දරුඵල ලබා ගැනීම, අපල උපද්‍රව දුරු කර ගැනීම, අණ විණ දුරු කර ගැනීම, හදි හූනියම් දුරු කර ගැනීම, ලෙඩ රෝග සුවකර ගැනීම.
මේ හැරුණු විට :- අධ්‍යයන කටයුතු සඳහා, විනෝදාස්වාදය සඳහා (ල. 05)

iii) නාට්‍යමය ලක්ෂණයන් - සමාරෝපනය, සංවාද භාවිතය, අනුකරණය, අනුරූපණය, අවස්ථා නිරූපණය, අභින භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය, චරිත නිරූපණය, රංග භූමිය භාවිතය, රංග භාණ්ඩ භාවිතය, ආදී වශයෙන් ලක්ෂණ 04 ක් වත් විස්තර කර ඇත්නම් (ල. 07)

03) i) ප්‍රධාන තේමාව - විජයාගමනය හා සම්බන්ධ ප්‍රවෘත්තියයි. (ල. 03)

ii) සිය රටින් පිටුවහල් කරනු ලැබූ විජය කුමරු හා සත් සියක් පිරිස ලංකාවට ගොඩ බට අතර, එහිදී තම්මැන්නා වෙරළේ දී කපු කටිමින් සිටි කුවේණිය නම් යක්ෂ කුමාරිකාව මුණ ගැසුණු බවත්, සිය මායා බලයෙන් විජය කුමරු අවනත කර ගන්නා ඇය ස්වකීය ඥාතීන් වනසා ලක් රජය අත්පත් කර ගැනීමට විජය කුමරුට සහාය වූ බවත්, කුවේණිය සිය අග බිසව විජය කුමරුට සහාය වූ බවත්, කුවේණිය සිය අග බිසව කරගත් විජය රජු, පසුව පඬි රජුගේ දියණිය අග බිසෝ කර ගනිමින් කුවේණි හා දෙදරුවන් මාලිගයෙන් පිටමං කළ බවත්, විජයට ශාප කළ ඇය මාළිගයෙන් පිටව යද්දී ඥාතීන් ඇයව මරා දැමූ අතර දරු දෙදෙනා වනගතවී වැද්දන් වූ බව ප්‍රචලිත කථා පුවතයි. (ල. 05)

iii) ජීවන දෘෂ්ටිය - 'කුවේණිය යනු මෙලොව සදාතන ගැහැණියයි.' පෙළෙන් උපුටා කරුණු දක්වා ඇත්නම්. (ල. 07)

## B කොටස

04. i. ග්‍රීක නාට්‍ය රචකයින් - ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස්, ප්‍රටිනස්, අරිස්ටෝෆානිස්, මෙනන්ඩ්‍රස්, ෆ්‍රෑනිබොස්, බොයිරිලොස් රචකයින් 04 ක් නම් කර ඇත්නම් (ල. 04)

ii. ග්‍රීක ගායන වෘන්දයේ කාර්යභාරය
01. අතීත සිදුවීම් ගෙනහැර පෑම.
02. චරිත හඳුන්වා දීම.
03. චරිතවලට අවවාද දීම.
04. භීෂණ ක්‍රියා හෙළිදරවු කිරීම.
05. චින්ත අභ්‍යන්තරය හෙළිදරවු කිරීම.
06. අදාල නාට්‍යයට පාදක වන ප්‍රදාන නගරවාසීන් නියෝජනය කිරිම.

කරුණු 03 ක් විස්තර කර ඇත්නම් (ල. 05)
කරුණු නම් කර තිබේ නම් පමණක් (ල. 03)

iii. ග්‍රීක කොමෙඩියක අන්තර්ගත විශේෂ ලක්ෂණ
01. පරමාර්ථය විනෝදාස්වාදයයි.
02. සමකාලීන් පුද්ගලයන් (දේශපාලන නායකයින් වැනි) නිර්දය ලෙස විවේචනය කිරීම.
03. කථා නායක - නායිකාවෝ සාමාන්‍ය පුද්ගලයෝ ය.
04. කථා නායක - දුර්ගුණ වලින් යුතු පුද්ගලයෝ ය.
05. වේෂ භූෂණ තාත්වික ය. විසිතුරු ය.
06. දෙබස් පද්‍යයෙන් රචනා විය. භාෂා විලාශය ව්‍යවහාර භාෂාවට සමීප විය.
07. ගායන වෘන්දය 24 කි. ගායන වෘන්දයේ නමින් නාට්‍යය හැඳින්විය.
08. පැතලි සෙරෙප්පු භාවිතා විය.
09. හිස් වැසුම් භාවිතා නොවීය.
10. පුරුෂ ලිංගේන්ද්‍රියන් අතිශයෝක්තියෙන් පැළඳ සිටියහ.

කරුණු හතරක් විස්තර කර ඇත්නම් (ල. 06)

05. i. ජනවන්දනා රංග භූමි :- 01. බුත් වේදිකා 02. බහු වේදිකා 03. මන්දිර වේදිකා 04. ජංගම රථ වේදිකා 05. අල්තාරය ඉදිරිපිට
මින් 04 ක් නම් කර ඇත්නම් (ල. 04 කි)

ii. ජනවන්දනා නාට්‍ය පල්ලියෙන් පිටත රඟ දැක්වීමට හේතු වූ කරුණු
01. දෙව් මැදුරු තුල ජනතාව වැඩිවීම.
02. විවිධ රංග උපක්‍රම භාවිතා කිරීමේදී ශාන්ත පරිසරය බාධා සිදුවීම.
03. පූජක පැලැන්තිය විවේචනය කිරීම.
04. කතෝලික සභාවෙන් තහංචි පැනවීම.

කරුණු 04 ක් නම් කිරීමට (ල. 05) කරුණු 03 ක් නම් කිරීමට (ල. 03)

iii. මොරලිටි නාට්‍ය රඟ දැක්වීම සඳහා භාවිතා කරන ලද විවිධ රංග උපක්‍රම
01. දොඹකර යොදා ගැනීම.
02. වේදිකා මත උමං දොරටු
03. ඩියුස් එක්ස් මැෂිනා වැනි යන්ත්‍ර භාවිතය
04. වෙස් මුහුණු භාවිතය
05. අපාය, ස්වර්ගය, වේදිකාව මත නිරූපණය වීම.

මින් කරුණු තුනක් විස්තර කර ඇත්නම් (ල. 06 )
(කරුණු දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නම් කර පමණක් ඇත්නම් ලකුණු 04 කි)

06. i. ඊඩිපස් රජ නාට්‍යයේ ප්‍රධාන චරිත 04 ක්.
01. ඊඩිපස් රජ 02. යෙකෙස්ටා බිසව 03. ටෙරේසියාස් 04. ක්‍රියෝන් (ල. 04)

ii. ඊඩිපස් රජ නාට්‍යයේ දී වේදිකාව මත නිරූපණය නොවන, එහෙත් දූතයන් හෝ අත්වැල් මගින් ප්‍රේක්ෂකයා වෙත හෙළිදරව් කරන භීෂණ ක්‍රියා,
01. ළදරු ඊඩිපස් කුමරුගේ දෙපා සිදුරුකොට විලංගු දැමීම.
02. කොරින්ත වැසියාගේ ඝාතනය.
03. ලායුස් රජු හා පිරිස ඝාතනය
04. යකිණිය සිය දිවි නසා ගැනීම.
05. යෙකෙස්ටා බිසව ගෙල වැලලා ගැනීම.
06. ඊඩිපස් රජු සියතින්ම සිය දෙනෙත් ඇද කර ගැනීම.
මෙයින් භීෂණ ක්‍රියා තුනක් නම් කර විස්තර කර ඇත්නම් (ල. 05)
ක්‍රියාවන් නම් කර පමණක් ඇත්නම් (ල. 03)

iii. ඊඩිපස් රජ නාට්‍ය පෙළෙන් මතු කෙරෙන ජීවන දෘෂ්ඨිය
01. අභියෝගයන්ට මුහුණ දීමේදී, අන්තවාදී ව නොගොස් ජීවිතයේ සෑම කර්තව්‍යයකදීම සම පැවැත්මක්, සම ජීවිකතාවක් සහිතව ජීවත් විය යුතු වීම, යෝග්‍ය ජීවන රටාවක් බව.
02. ඊඩිපස් රජ චරිතය - දයාහරිත පාලකයෙක්, අවංක මිනිසෙක්
03. ක්‍රියෝන්ගේ චරිතය - කරුනා මහිමය, අවංක බව,
04. යොකේස්ටා චරිතය - ස්වාමී භක්තිය
05. අත්වැල් කණ්ඩායම - පත්‍රයන්ට හොඳ නරක කියා දීම.
ප්‍රමාණවත් ලෙස නිවැරදි කරුණු ඉදිරිපත් කිරීමට (ල. 06)

**නැතහොත්**

i. රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රධාන චරිත හතරක්,
01. නූවුරා 02. ටෝවල්ඩ් හෙල්මර් 03. දොස්තර රන්ක්
04. ලින්ඩෙ මහත්මිය (ක්‍රිස්ටීන්) 05. නොතාරිස් නීල්ස් කෘග්ස්ටාඩ් චරිත 04 ක් නම් කිරීමට (ල.04)

ii. රූකඩ ගෙදර නාට්‍ය විකාශනය සඳහා භාවිතා කරන ලද සංකේත
01. නත්තල් ගස 02. මැකරූන්
03. තරන්තලා ඇඳුම හා තරන්තාරා නැටුම 04. ගිනි උඳුන
05. කළු කුරුසය සහිත ලියුම් කවරය 06. කළු කබාය
07. පැද්දෙන පුටුව
මේවා භාවිතා කර ඇති ආකාරය විස්තර කර ඇත්නම් - (සංකේත තුනක්වත් ) (ල. 05)
(සංකේත තුනක් හෝ ඊට වඩා නම් කර පමණක් නම් 03)

iii. අදාළ පිළිතුරු තර්කානුකූලව ලියා ඇත්නම් (ල. 06)